# කඳවුරු හා යුද අපරාධ

මානව අයිතිවාසිකම් පිළිබඳ බටහිරයන්ගේ දෙපිටකාට්ටු පිළිවෙත ගැන බොහෝ දෙනා කතා කරති. ඇෆ්ගනිස්තානයේ නැති මානව අයිතිවාසිකම් ලංකාවේ ක්‍රියාත්මක කිරීමට බටහිරයන් හා ඔවුන්ගේ හෙන්චයියන් දරණ උත්සාහය ගැන ඇතැමුන් සඳහන් කරන්නේ කළකිරීමෙනි. පසුගිය දා ඉරාකයේ දී ඇමරිකාවේ හිටපු ජනාධිපති බුෂ්ට සපත්තු පහරක් එල්ල කළ පුද්ගලයා හිරෙන් නිදහස් කෙරිණි. ඔහු තමාට දුන් වධහිංසා ගැන විස්තරයක් කර තිබුණි. ඒ වධහිංසා බන්ධනාගාර නිලධාරීන්ගේ කෙළි කවටකම් නම් නොවන බව බටහිර ගැත්තකුට වුව ද වැටහෙනු ඇත. ඇමරිකාවේ ඇති කඳවුරු ගැන බොහෝ දෙනා දනිති. එහි ජනමාධ්‍යවේදීන් කිසිම නඩු විභාගයක් නැතිව දීර්ඝ කාලයක් රඳවාගෙන සිටින බව පාකියසෝති සරවනමුත්තුට හා ජෙහාන් පෙරේරාට බිලේක්ගෙන් අසා දැනගත හැකි ය. අති මහත් බලයක් ගොඩනගාගෙන ඇති ඇමරිකාව නමින් හැඳින්වෙන ඇමරිකන් එක්සත් ජනපදය එවැනි දැවැන්ත බලයක් තිබිය දී ද රාජ්‍යයට එල්ලවන තර්ජනවල දී කිසිම ඉඩක් බුරුලක් නො දෙයි.

එහෙත් ලංකාවට රාජ්‍යයෙහි ස්වෛරීභාවය ආරක්ෂා කරගැනීමට අවස්ථාවක් නොදීමට බ්‍රිතානිය, ප්‍රංශය, ඇමරිකාව ප්‍රධාන බටහිර රටවල් කතයුතු කරයි. එහෙත් මේ බටහිරයන්ගේ දෙපිටකාට්ටු ප්‍රතිපත්තියක් නො වේ. අපි ලංකාවෙන් ම උදාහරණ ගනිමු. අප බොහෝ අවස්ථාවල මතක්කර දී ඇති පරිදි 1971 දී 1989-92 කාල පරිච්ඡේදයේ දී ජ වි පෙරමුණට සම්බන්ධ යැයි සැලකුණු බොහෝ දෙනෙක් මරණයට පත්කරනු ලැබූහ, එසේත් නැත්නම් දරුණු වධහිංසාවලට ගොදුරු කෙරුණාහ. රනිල් වික්‍රමසිංහ මහතා ද දන්නා බටලන්ද කඳවුර ජ වි පෙ සාමාජිකයන්, හිතවතුන් ලෙස සැකකරනු ලැබූවන් රඳවා තිබූ කඳවුරුවලින් එකක් පමණකි. තැන තැන තිබූ ටයර් සෑය පිළිබඳ ව ජනාධිපතිතුමා ද පසුගිය දිනවල මතක් කර තිබුණි. එහෙත් ඒ කාල පරිච්ඡේදවල ලංකාවේ මානව අයිතිවාසිකම් රැකීමට පාකියසෝති සරවනමුත්තු හෝ ජෙහාන් ප්‍රනාන්දු හෝ ක්‍රිස්තියානි සාම මණ්ඩල හෝ උනන්දු වූයේ නැත. රනිල් තමාට ඒ ගැන මතකයවත් නැති අයුරින් ක්‍රියා කරයි.

බටහිර මානව අයිතිවාසිකම් පිළිබඳ මගේ ද විවරණයක් වෙයි. එපමණක් නොව බුද්ධදහම පිළිබඳව ද මගේ විවරණයක් වෙයි. මෙවැනි විවරණ කළ පළමු තැනැත්තා හෝ අවසාන තැනැත්තා හෝ මා නොවන බව මුග්ධයන් හා විවිධ න්‍යාය පත්‍ර යටතේ ක්‍රියාකරන්නන් හැරෙන්නට අනෙක් අය දනිති. අටුවා ටීකා ටිප්පණී යනු අප වැනි පුද්ගලයන්ගේ විවරණ මිස බුද්ධවදන නො වේ. කලකට පෙර ආත්මයක් ගැන කතාකිරීම මෙන් ම අනාත්මයක් ගැන කතාකිරීම ද වැරදි බව පැවසූ මහා ලේඛකයෝ වූහ. පුනබ්භවයක් නැතැයි කියන පඬිවරු වෙති. සමාජය ඒ සියල්ල ඉවසයි. එහෙත් අද ඇතැමුනට අනිත්‍ය දුක්ඛ අනාත්ම යන්නට පටහැණි නොවන ආකාරයට මා කරන විවරණ විස බවට පත් වී ඇත. ඉතිහාසය, භෞතික විද්‍යාව, බුද්ධදහම ආදී කිනම් ක්ෂෙත්‍රයක වුව ද මා විවරණ කරන්නේ පූජාව පූජනීයානං යැයි බොරුවට කියමින් තම කුහකත්වය වසාගැනීමට තැත්කරන වංචනිකයකු කියන ආකාරයට හිතුමතයට නොව යම් පරාසයක සංගතවන ආකාරයට ය. අටුවාවවත් අයින්ස්ටයින්ගේ ප්‍රවාදවත් කරගසාගෙන සිටීම මගේ ප්‍රතිපත්තිය නො වේ. අපි අපේ ප්‍රවාද පමණක් නොව නව අටුවා ද නිර්මාණය කළ යුතු වෙමු. ප්‍රවාද මනස ද ඇතුළු ලෝකය තේරුම් ගැනීම සඳහා ය. අටුවා බුද්ධවදන තේරුම් ගැනීම සඳහා ය. එහෙත් මේ කර්තව්‍යයන් දෙක එක්වන අවස්ථා ද වෙයි. ඒ කුමක් වුවත් අප සියල්ල කරන්නේ සිංහල බෞද්ධ සංස්කෘතියට සාපේක්ෂව ය.

බටහිර මානව අයිතිවාසිකම් ඇතිවූයේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ප්‍රතිඵලයක් ලෙස ය. කතෝලික චින්තනයේ පුද්ගලයා වෙනුවට සමස්තය (හා රාජ්‍යය) ඉස්මතු කෙරිණි. රාජ්‍යය පුද්ගලයාට ඉහළින් වූ අතර පාප් වහන්සේ රජු ප්‍රධාන පූජකවරුන් හා රදළයන් හැරෙන්නට අනෙක් පුද්ගලයන්ට තිබූ ඊනියා අයිතියක් නැත. අඩුම තරමින් ඔවුහු පුද්ගලයන් ලෙස සලකනු නො ලැබුණාහ. පහළොස්වැනි සියවසේ පමණ සිට පැන නැගුණු බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ චින්තනය වූ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි සමස්තයට තිබූ ප්‍රධානත්වය පුද්ගලයාට දෙනු ලැබිණි. බටහිරයන්ගෙන් ඉගෙනගත් මෙරට ඇතැම් බෞද්ධයන් ද කොටුවී ඇති ඇරිස්ටෝටලීය න්‍යායෙහි කොටු වූ බටහිරයන්ට එක්කෝ පුද්ගලයා ප්‍රධාන විය නැත්නම් සමස්තය ප්‍රධාන විය. ඒ දෙකින් එකක්වත් ප්‍රධාන නොවන සමාජයක් ගැන සිතීමට බටහිරයන්ට නො හැකි ය.

© Prof. Nalin De Silva

එහෙත් මෙයින් කියැවෙන්නේ බටහිර සියළු පුද්ගලයන්ට මානව අයිතිවාසිකම් ඇත යන්න ය. ඔවුන්ගේ මානව අයිතිවාසිකම් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට සාපේක්ෂ ය. එහි මානව අයිතිවාසිකම් ඇත්තේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය වෙනුවෙන් හා බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වෙනුවෙන් පෙනී සිටින පුද්ගලයන්ට ය. බුෂ්ට සපත්තුවෙන් ගැසූ තැනැත්තාට මානව අයිතිවාසිකම් නැත. මෙය ඇතැමුනට දෙබිඩි ප්‍රතිපත්තියක් ලෙස පෙනෙන්නේ ඔවුන් මානව අයිතිවාසිකම් යනු ඊනියා නිරපේක්ෂ ප්‍රපංචයක් ලෙස සලකන සලකන බැවිනි. මානව අයිතිවාසිකම් ද අනෙක් දෑ මෙන් ම සාපේක්ෂ ය. බටහිරයන්ගේ මානව අයිතිවාසිකම් ඇත්තේ ඔවුන්ගේ රාජ්‍ය ආරක්ෂාකිරීමට හා බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අගයන පුද්ගලයන්ට යම් ප්‍රමාණයකට රාජ්‍යයෙන් නිදහසක් ලබාගැනීමට ය. ඒ අතර බටහිරයෝ ඔවුන්ට විරුද්ධ රාජ්‍ය නැතිකිරීම සඳහා ද අනෙක් සංස්කෘතීන් හැකිනම් නැතිකිරීම සඳහා ද දේශපාලන උපකරණයක් ලෙස මානව අයිතිවාසිකම් යොදාගනිති. ඒ දෙපිටකාට්ටු ප්‍රතිපත්තියක් නොව බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ප්‍රතිපත්තිය ය.

ඒ පසුබිමෙහි ලංකාවේ ජ වි පෙ සාමාජිකයන්ට හා හිතවතුන්ට ඒ පිළිවෙත යටතේ මානව අයිතිවාසිකම් නැති බව වටහාගැනිම අපහසුවක් නො වේ. එමෙන් ම සිංහලත්වයට එරෙහිව ක්‍රියාකරන දෙමළ ජාතිවාදීන්ට, සරවනමුත්තු, ජෙහාන් පෙරේරා ආදීන්ට මානව අයිතිවාසිකම් ඇත. වවුනියාවේ කඳවුරු වධකාගාර, මරණයට කැපකළුවුන්ගේ කඳවුරු ආදී වශයෙන් හඳුන්වන්නෝ එහි ශිෂ්‍යයන් විභාගවලට පෙනී සිටින බව, කඳවුරුවල වෙසෙන්නන්ට සෞඛ්‍ය ආදී පහසුකම් ඇති බව ආදිය නො සලකති. එමෙන් ම මේ කඳවුරුවල සිටිනන්නන් නිදහස්කිරීමට පෙර එහි සිටින කොටින් හඳුනාගත යුතු බව හා භූමිය බිම්බෝම්බවලින් නිදහස්කරගත යුතු බව ඔවුහු නො පිළිගනිති. එසේ කරන්නේ ඊනියා මානව අයිතිවාසිකම් මුවාවෙන් ආණ්ඩුවට චෝදනාකිරීමට මිස අනෙකකට නො වේ. බටහිරයන්ට අද ප්‍රශ්නයක් වී ඇත්තේ මේ ආණ්ඩුව මිස ඊනියා මානව අයිතිවාසිකමක් නො වේ. ජෙහාන් පෙරේරා පාකියසෝති ආදීන්ට ද ප්‍රශ්නය ආණ්ඩුවේ ජාතිකත්වය ය.

මෙයට සමගාමීව යුද අපරාධකරුවන් ලෙස රජයේ වගකිවයුත්තන් ඊනියා ජාත්‍යන්තර අධිකරණය ඉදිරියට ගෙන යෑමේ කතාව දැන් නැවතත් පණ ගැන්වී ඇත. මෙහි ඇති ඊනියා ජාත්‍යන්තර නෛතික තත්වය කුමක්දැයි අපි නො දනිමු. එහෙත් මෙරට යුද්ධයක් නොතිබුණු බව අපි දන්නෙමු. අප සැමදාමත් කියා සිටියේ මෙරට යුද්ධයක් නොතිබූ බව ය. රටවල් දෙකක් අතර කෙරුණු යුද්ධයක් හෝ සිවිල් යුද්ධයක් හෝ මෙරට පසුගිය අවුරුදු හැටක කාලයක් තිස්සේ නො වී ය. වරින් වර වැඩවර්ජන, හර්තාල්, ජ වි පෙ කැරළි කෝළාහළ, කොටි හා වෙනත් දෙමළ ත්‍රස්තවාදී සංවිධාන විසින් කරන ලද බෝම්බ පිපිරීම් ආදිය නම් තිබී ඇත. එහෙත් ඒ එකක්වත් යුද්ධ නො වෙයි. රජයට විරුද්ධව රාජ්‍යය බෙදීම සඳහා ආයුධ අතට ගත් ත්‍රස්තවාදී කල්ලියකට එරෙහිව හමුදා මෙහෙයුම් කිරීම යුද අපරාධයක් වන්නේ කෙසේ ද? යුද්ධයක් නැතිව යුද අපරාධ තිබිය හැකි නො වේ. ජ වි පෙරමුණේ කැරළි සම්බන්ධයෙන් කරන ලද මෙහෙයුම්වල දී යුද අපරාධ සිදු නොවී නම් දැන් එසේ සිදුවන්නේ කෙසේ ද? යුද්ධය යන්න මෙහෙයුම්වලට ගිය කාලය අනුව තීරණය වන්නක් නො වේ. විජයවීර මරා දැමීම යුද අපරාධයක් නොවී ප්‍රභාකරන් මරාදැමීම යුද අපරාධයක් ලෙස සලකන්නේ කොටින්ට විරුද්ධව කරන ලද මෙහෙයුම් සඳහා එක්තරා ඉංගිරිසි මාධ්‍යවේදියකු ඊළාම් යුද්ධය යන පදය භාවිතා කළ බැවින් ද? 1953 දී හර්තාලයේ දී මියගිය නවදෙනා පිළිබඳව ද යුද අපරාධ චෝදනා වේ ද? අනෙක් අතට බෝම්බ පුපුරවා අහිංසක මිනිසුන් මැරූ ප්‍රභාකරන් ඇතුළු ත්‍රස්තවාදීන්ට යුද අපරාධ චෝදනා නැත් ද? කෙරුණේ යුද්ධයක් නම් දෙපැත්තක් තිබිය යුතු ය. තනි අතින් අප්පුඩි ගැසීමට නොහැකිවාක් මෙන් ම එක් පැත්තකට පමණක් යුද්ධ කළ හැකි නො වේ. යුද්ධයක් කෙරී ඇත්නම් ප්‍රභාකරන් ජීවතුන් අතර නැතිවුවත් විභාගයක් කර ඔහු හා අනෙක් අය යුද අපරාධකරුවන් ලෙස වරදකරුවන් කිරීමට බාධාවක් නැත. විශේෂයෙන් ම ආයුධ සැපයූ කේ පද්මනාදන්ට විරුද්ධව චෝදනා ඉදිරිපත් කළ හැකි ය. එහෙත් අයකුට කිවහැක්කේ යුද්ධයක් නැතිවුවත් ආණ්ඩුව හමුදා මෙහෙයුම්වල දී යම්කිසි ජාත්‍යන්තර එකඟතාවන්ට පටහැණි නොවන ලෙස ක්‍රියාකළ යුතු බව ය. මේ එකඟතා කවරේ ද? බටහිරයන් දුන් අවි අතට ගෙන රජයේ හමුදාවල භටයන් මැරීමට එන ත්‍රස්තවාදීන් හමුවේ හමුදා භටයන් කළ යුත්තේ කුමක් ද? පන්සිල් ගැනීම ද? අත් අඬංගුවට පත් වූ විජේවීර මරා දැමීමට විරුද්ධව නඩුව ඇසීමට වහා ම ක්‍රියාත්මක වී ඉන්පසු ප්‍රභාකරන්ගේ නඩුව ගනිමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva